# මනෝසමාජීය සහාය වැඩසටහන

## හැඳින්වීම

හානිපූරණය සඳහා වන කාර්යාලයේ විධිවිධානයන්ට අනුව "පීඩාවට පත් තැනැත්තන්" හට (ශ්‍රී ලංකාව තුළ ඇති වූ ගැටුම්කාරී වාතාවරණයන් හේතුවෙන් පීඩාවට පත් තැනැත්තන්) සහන ලබා දීම සඳහා මෙන්ම එකී පීඩාවට පත් තැනැත්තන්ගේ ජීවිත නැවත ගොඩනංවා ගැනීමට හෝ ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා සහාය ලබා දීම අරමුණු කරගෙන පෙර කී වින්දිතයන්ගේ අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් එහි ප්‍රධානතම මැදිහත්වීමක් ලෙස මනෝසමාජීය සහාය වැඩසටහනක් නිර්මාණය කර ඇත. ගැටුම්වලට මුහුණ පෑ වින්දිතයන් එකී ගැටුම්වලට හා ප්‍රචණ්ඩත්වයන්වලට නිරාවරණය වීමේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන් චිත්තවේගීය හා මානසික පීඩාවන්ට මුහුණ පා ඇත යන සහ, එම නිසා එකී ප්‍රචණ්ඩත්වයට මුහුණ දුන් වින්දිතයන්ගේ මනෝසමාජීය යහපැවැත්ම ප්‍රවර්ධනය අරමුණු කරගත් වෘත්තීයමය සහායක් අත්‍යාවශ්‍ය වේ යන පිළිගැනීම මත මෙම වැඩසටහන හඳුන්වා දී ඇත.

## වැඩසටහනේ ප්‍රධාන ලක්ෂණ

- මෙම වැඩසටහන නියමු ව්‍යාපෘතියක් ලෙස මූලිකවම ක්‍රියාත්මක කරනු ලැබේ.
- ප්‍රමුඛතා කාණ්ඩවලට අයත් වින්දිතයන් සඳහා මෙම නියමු ව්‍යාපෘතිය තොරාගත් ප්‍රදේශවල ක්‍රියාත්මක කරනු ලැබේ.
- වින්දිතයන් සමඟ එක් ව කටයුතු කිරීම සඳහා සිද්ධි කළමනාකරුවන් මෙම යාන්ත්‍රණය සඳහා යොදා ගනු ඇත.
- කාර්යයන් ඉටු කිරීම සඳහා සිද්ධි කළමනාකරුවන් විසින් විනයානුකූල ක්‍රියාවලියක් අනුගමනය කරනු ඇත (සිද්ධි කළමනාකරණ ක්‍රියාවලිය[1] සඳහා වන ගැලීම් සටහන බලන්න).
- අවශ්‍යතා ඇගයීමට සමගාමීව -
  - අවශ්‍යතා මට්ටම මත පදනම්ව පුද්ගලයින් මනෝචිකිත්සක ප්‍රතිකාර සඳහා ඒ පිළිබඳව කටයුතු කරන වෘත්තිකයන් වෙත යොමු කරනු ලැබේ; හා/ හෝ
  - අනෙකුත් සමාජ ආර්ථිකමය අවශ්‍යතාවයන් හඳුනාගත් විට සහාය ලබා දීම සඳහා යෝග්‍ය මැදිහත්වීම් සිදු කරනු ඇත.
- වින්දිතයන් හට අවශ්‍ය වන සහාය ලබා දීම සඳහා සිද්ධි කළමනාකරුවන් ඔවුන් සමඟ අඛණ්ඩව කටයුතු කරනු ඇත.
- සිද්ධි කළමනාකරුවන්ගේ පුහුණුව අවසන් වූ වහා නියමු ව්‍යාපෘතිය ආරම්භ කරනු ඇත.
- නියමු ව්‍යාපෘතියෙන් ලබා ගන්නා දැනුම භාවිත කරමින් නියමු ව්‍යාපෘතිය නැවත අර්ථකථනය කරමින් දිවයින පුරා ඇති අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ද මෙය පුළුල් කරනු ඇත.

---

[1] පහත රූප සටහන හා සම්බන්ධ විය යුතුය

## තෝරාගත් ප්‍රදේශ

නියමු ව්‍යාපෘතිය සඳහා ඉලක්ක ගත කණ්ඩායම් පහත ප්‍රදේශවලින් තෝරාගනු ලබන අතර, ඔවුන් තෝරා ගැනීමේ දී එම ප්‍රදේශවල ජීවත් වන වින්දිතයන් නියෝජනය වන පරිදි නියැදියක් පමණක් පදනම් කරගෙන ඇත.

1. ආරයම්පති (මන්මුනෙයි පත්තු) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය (මඩකලපුව දිස්ත්‍රික්කය)
2. කරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය (කිළිනොච්චි දිස්ත්‍රික්කය)
3. කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය (කුරුණෑගල දිස්ත්‍රික්කය)
4. මාතර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය (මාතර දිස්ත්‍රික්කය)
5. නවිතන්වේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය (අම්පාර දිස්ත්‍රික්කය)

## වින්දිතයන්ගේ ප්‍රමුඛතා කාණ්ඩ

නියමු ව්‍යාපෘතිය සඳහා පුද්ගලයන් තෝරා ගැනීමේ දී පහත කාණ්ඩයන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ:

1. කුඩා ළමුන් හා පහළ මට්ටමේ ආදායමක් ඇති කාන්තා මූලික පවුල්
2. අතුරුදහන් වූ අයගේ පවුල්
3. බරපතල ලෙස ආබාධිත තත්ත්වයට පත් වූ තැනැත්තන් හා ඔවුන්ගේ පවුල්

ඉහත කණ්ඩායම්, ලිංගික හා ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය, ළමා අපචාර හා/ හෝ ආර්ථිකමය වශයෙන් අවදානම් තත්ත්වයකින් පෙළෙන බව හඳුනාගෙන ඇති බැවින් එම කණ්ඩායම්වලට ප්‍රමුඛතාවය ලබා දී ඇත.

හානිපූරණය සඳහා වන කාර්යාලයේ දත්ත සමුදාය, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ලබා දෙන යොමු කිරීම් භාවිතයෙන් මේ සඳහා සහභාගීවන්නන් හඳුනාගනු ඇත.

## සිද්ධි කළමනාකරුවන්

පළමු පියවර ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි නිළධාරීන් විසි (20) දෙනෙකු හා හානිපූරණය සඳහා වන කාර්යාලයේ නිළධාරීන් පස් (05) දෙනෙකු බැගින් සිද්ධි කළමනාකරුවන් ලෙස පුහුණු කර ඇත. පවතින කොවිඩ් 19 වසංගතය හේතුවෙන් උද්ගත වී ඇති තත්ත්වය නිසා පෙර අපේක්ෂා කරන ලද නේවාසික පුහුණු වැඩසටහන් මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලදී. මෙය අරමුණු කරගෙන **සිද්ධි කළමනාකරුවන් පුහුණු කිරීමේ අත්පොත**[2] නිර්මාණය කරන ලදී.

සිද්ධි කළමනාකරුවන්ගේ කාර්යයභාරය නම්-

- පීඩාවට පත් තැනැත්තාගේ නිවසට ගොස් එම පුද්ගලයා හා පවුලේ සාමාජිකයන් හමු වී, අවශ්‍යතා ඇගයීම සඳහා සම්බන්ධ වීමට ඔහුගේ/ ඇයගේ කැමැත්ත ලබා ගැනීම, විශ්වාසය ගොඩනගා ගැනීම හා, අනතුරුව ප්‍රශ්නාවලියට ප්‍රතිචාර දැක්වීම සඳහා ඔවුන්ට සහාය වීම.
  අවශ්‍යතා ඇගයීම අරමුණු කරගනිමින් නිර්මාණය කරන ලද **අවශ්‍යතා ඇගයීමේ ප්‍රශ්නාවලිය**[3] භාවිත කරමින් මෙම අවශ්‍යතා ඇගයීම සිදුකරනු ඇත.

[2] සිද්ධි කළමනාකරුවන් සඳහා වන පුහුණු අත්පොත හා සම්බන්ධ වේ (වෙන් වූ ලේඛනයකි)
[3] අවශ්‍යතා ඇගයීමේ ප්‍රශ්නාවලිය හා සම්බන්ධ වේ (පහත)

- ප්‍රශ්නාවලිය සඳහා ලබා දී ඇති ප්‍රතිචාර ඇගයුම් කිරීම හා ගැටලුවේ ස්වභාවය හඳුනා ගැනීම. *සංවර්ධනය හා මානුෂවාදී මැදිහත්වීමේ මනෝසාමාජීය ඇගයීම* පිළිබඳ රාමුවේ (PADHI Framework) අනුවර්තිත අනුවාදයක් භාවිත කරමින් සිද්ධි කළමනාකරුවන් විසින් පුද්ගලයන්ගේ මනෝසාමාජීය අවශ්‍යතා ඇගයුම් කරනු ඇත.

  සටහන: සංවර්ධනය හා මානුෂවාදී මැදිහත්වීමේ මනෝසාමාජීය ඇගයීම පිළිබඳ රාමුව යනු මානුෂවාදී මැදිහත්වීම් තුළ යහපැවැත්ම, පීඩාවන් හා වේදනාවන් පිළිබඳ දේශීය අවබෝධය පැහැදිළි කරනු වස් කොළඹ විශ්වවිද්‍යාලය විසින් සංවර්ධනය කරන ලද වලංගු මෙවලමකි. සමාජ ප්‍රතිපත්ති විශ්ලේෂණ හා පර්යේෂණ කේන්ද්‍රය (2009) බලන්න. *මෙවලමක්, මාර්ගෝපදේශයක්, රාමුවක්. සංවර්ධනය සඳහා වන මනෝසාමාජීය ප්‍රවේශයේ විස්තරය* [මිනුම්දණ්ඩ, මෙවලම]. කොළඹ: සමාජ ප්‍රතිපත්ති විශ්ලේෂණ හා පර්යේෂණ කේන්ද්‍රය, කොළඹ විශ්වවිද්‍යාලය.

- සෑම පුද්ගලයකු හා/ හෝ පවුලේ සාමාජිකයන් සමඟ සමීප සබඳතාවයකින් කටයුතු කරමින් හඳුනාගත් අවශ්‍යතා මත පදනම්ව කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන අරමුණු ඉස්මතු කරන ආකාරයේ, එකී සෑම පුද්ගලයෙකු හා/ හෝ පවුලක් සඳහා රිසිකරණය කරනු ලැබූ සිද්ධි සැලසුමක් නිර්මාණය කිරීම.

- අරමුණු කරා ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. මෙහිදී වෘත්තීය උපදේශන සේවාවන් ලබා ගැනීම සඳහා රජයේ උපදේශන සහකරුවන් වෙත ද, විශේෂ මනෝචිකිත්සක ප්‍රතිකාර සඳහා ප්‍රාදේශීය රෝහල්වල මනෝචිකිත්සක ඒකක වෙත ද, ස්ත්‍රී පුරුෂභාවය මත පදනම්ව සිදු වූ ප්‍රචණ්ඩකාරී ගැටළු සඳහා කාන්තා සංවර්ධන නිළධාරීන් වෙත ද, ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් වන ගැටළු සඳහා ළමා පරිවාස නිළධාරීන් වෙත ද යොමු කිරීමට කටයුතු කිරීම මේ සඳහා ඇතුළත් වේ. තව ද, සමාජීය ආර්ථික අවශ්‍යතා සම්බන්ධයෙන් අනෙකුත් ආයතන සමඟ පසුවිපරම් කරමින් කටයුතු කිරීම මේ සඳහා ඇතුළත් වේ.

- වින්දිතයන් සමඟ මෙන්ම ඔවුන්ව යොමු කරනු ලැබූ අනෙකුත් වෘත්තිකයන් සමඟ ද පසුවිපරම් කටයුතු කරමින් එහි ප්‍රගතිය අධීක්ෂණය කිරීම හා සේවාලාභියාගේ ප්‍රගතිය පිළිබඳ සවිස්තරාත්මක සිද්ධි සටහන් ලේඛනගත කිරීම.

- වින්දිතයන්ට ලබා දෙනු ලබන සහාය තවත් පුළුල් කිරීම සඳහා මෙන්ම අවශ්‍ය වූ විට සිද්ධි සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ පාර්ශ්වකරුවන් සමඟ කටයුතු කිරීම.

- වින්දිතයන් සඳහා සේවා, මූලික අවශ්‍යතා සහ අනෙකුත් පහසුකම් ලබා දීමේ හැකියාව පිළිබඳ කටයුතු සිදුකිරීම.

- ප්‍රජා සම්පත් සම්බන්ධයෙන් හා යෝග්‍ය සම්පත් සඳහා වින්දිතයන් යොමු කිරීමේ ක්‍රියාවලීන් සම්බන්ධයෙන් ඔවුන්ව පුරුදු පුහුණු කිරීම.

- සංශෝධන අවශ්‍ය වන්නේ ද යන්න හඳුනාගැනීම සඳහා සිද්ධි සැලසුම සමාලෝචනය කිරීම. කාලයක් ගතවන විට පුද්ගලයන්ගේ අවශ්‍යතා හා තත්ත්වයන් වෙනස් විය හැකි අතර, ඔවුන්ගේ තත්කාලීන අවශ්‍යතා ග්‍රහණය වන සේ සිද්ධි සැලසුම් ද නම්‍යශීලී කළ යුතුය. පිඩාවට පත් තැනැත්තෙක්ගේ සිද්ධියක් ක්‍රියාකාරීව කළමනාකරණය කිරීමේ කාලය පීඩාවට පත් තැනැත්තා හා/ හෝ ඔහුගේ/ ඇයගේ පවුලේ අය මුහුණ දුන් ගැටළුවේ සංකීර්ණභාවය මත පදනම්ව වෙනස් විය හැකි අතර, එය මාස ගණනක සිට වසර ගණනාවක් දක්වා වුව ද විය හැකි ය.

# සිද්ධි කළමනාකරණ ක්‍රියාවලිය

